" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/30-38/FI/01
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2025.01.24

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.01.23 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2024 හා 2024.12.30 | "ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරි කටයුතු ඇරඹීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2024 හා 2024.12.24 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වසර |
| 03. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 07/2020 (1) හා 2024.10.30 | පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා අදාල කර ගැනීම |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2011 (1) හා 2024.11.29 | ජාතික කොඩිය නිවැරදි භාවිතය |
| 05. | පොදු චක්‍රලේඛ ලිපි අංක 02-55/2023 හා 2023.03.21 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මඟින් පවත්වනු ලබන ආංශික ප්‍රවේශ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව), බී.එස්.සී (ගෞරව), වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී (ගෞරව), අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම - 2023 |

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 06. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2024 හා 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යුනිකේත හා අනුකූල අක්ෂර භාවිතා කිරීම |
| 07. | ජනාධිපති කාර්යාල චක්‍රලේඛ PS/SB/Circular/1/2025 හා 2025.01.01 | විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ / ආයතන පවත්වනු ලබන අන්තර්ක්‍රියා |
| 08. | ස්වදේශ කටයුතු චක්‍රලේඛ 01/2025 හා 2025.01.10 | 77 වන නිදහස් දින සමරු උළෙල - 2025 |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එස්.එම්.එච්. කුසුම්සිරි,
පරිපාලන නිලධාරි
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092607
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை
GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.

ඔබේ අංකය / உமது இல / Your Ref: CSWP/ADM/30-38/FI/01

මගේ අංකය / எனது இல / My Ref: GOS/ADM/6/2/19-2025

දිනය / திகதி / Date: 2025.01.23

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" - "பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை" - "People Friendly Excellent Public Service"

23 JAN 2025

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2025.01.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2024 | 2024.12.30 | "ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරී කටයුතු ඇරඹීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2024 | 2024.12.24 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වසර |
| රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 07/2020(1) | 2024.10.30 | පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා අදාල කර ගැනීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2011(1) | 2024.11.29 | ජාතික කොඩිය නිවැරදි භාවිතය |
| පොදු චක්‍රලේඛ 02-55/2023 | 2023.03.21 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන ආංශික ප්‍රවේශ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව), බී.එස්.සී (ගෞරව) වෛද්‍ය රසායනාගාර තාක්ෂණ විද්‍යාඥ හා බී.එස්.සී (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලි හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම -2023 |

| ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் / Secretary to the Governor | සහකාර ලේකම් I / உதவிச் செயலாளர் I / Assistant Secretary I | සහකාර ලේකම් II / உதவிச் செயலாளர் II / Assistant Secretary II | නීති නිලධාරී / சட்ட அதிகாரி / Legal Officer | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel : 011-2092816<br>Fax : 011-2092813<br>e-mail: secretary@secgov.wp.gov.lk | e-mail: ass.secretary1@secgov.wp.gov.lk | e-mail: ass.secretary2@secgov.wp.gov.lk | Tel : 011-2092819<br>e-mail: legalofficer@secgov.wp.gov.lk | e-mail: ao@secgov.wp.gov.lk | Tel : 011-2093670<br>Fax : 011-2092771<br>e-mail: governoroffice@secgov.wp.gov.lk |

| | | |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2024 | 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතුසඳහා යුනිකේත හා අනුකූල අක්ෂර භාවිත කිරීම |
| ජනාධිපති කාර්යාල චක්‍රලේඛ PS/SB/Circular/1 / 2025 | 2025.01.01 | විදේශ රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ/ ආයතන පවත්වනු ලබන අන්තර්ක්‍රියා |
| ස්වදේශ කටයුතු චක්‍රලේඛ 01/2025 | 2025.01.10 | 77 වන නිදහස් දින සමරු උළෙල - 2025 |

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112-092816
ෆැක්ස් - 0112-092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT


චක්‍රලේඛ අංකය: PS/SB/Circular/1/2025
2025 ජනවාරි මස 01 වන දින

අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් ප්‍රධාන ලේකම්වරු
පළාත් ආණ්ඩුකාර ලේකම්වරු වෙත

**විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ/ ආයතන පවත්වනු ලබන අන්තර් ක්‍රියා**

ජනාධිපති ලේකම්ගේ අංක PS/EAD/Circular/16/2022 දරන 2023 ජනවාරි 09 දිනැති චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය 2025 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වේ.

විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ අන්තර් ක්‍රියා පැවැත්වීමේ දී රජයේ ආයතන විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛයෙහි අන්තර්ගත ය. ශ්‍රී ලංකා රාජ්‍යයේ විවිධ ආයතන (උදා. අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු) සහ විදෙස් රජයන්, ආයතන සහ ඔවුන්ගේ රාජ්‍යතාන්ත්‍රික නියෝජනයන් අතර පවත්නා විධිමත් හා කාර්යපාදක සබඳතා විධිමත් කිරීම සහ ක්‍රමානුකූලව සකස් කිරීම මෙමඟින් සිදු කෙරෙනු ඇත.

පහත සඳහන් මාර්ගෝපදේශයන්ට දැඩිව අනුගත විය යුතු බව ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇත. එබැවින්, මෙම චක්‍රලේඛයෙහි සඳහන් අන්තර්ගතය ඔබගේ ගරු අමාත්‍යවරයාගේ/ ගරු ආණ්ඩුකාරවරයාගේ/ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ ඔබ යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශයේ/ පළාත් සභාවේ/ දෙපාර්තමේන්තුවේ සහ ආයතනයන්හි නිලධාරින්ගේ අවධානයට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. <u>සාමාන්‍ය</u>

1961 ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ 41(2) වගන්තියට සහ ජාත්‍යන්තරව පිළිගත් පරිචයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රධාන ආයතනය වන්නේ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයයි. මෙය, ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ දී, රාජ්‍යයේ විවිධ අස්තිත්ව සමගාමී සම්බන්ධීකරණයෙන් ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා වේ.

2. <u>ශ්‍රී ලංකා රජය සහ විදෙස් රජයන්/ අස්තිත්ව අතර සන්නිවේදන මාධ්‍යය</u>

2.1 විදෙස් රජයන් සහ අස්තිත්ව සමඟ සිදු කරනු ලබන සියලුම සන්නිවේදන, මූලික වශයෙන්, පහත සඳහන් කරුණුවලට යටත්ව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය මඟින් යොමු කළ යුතු ය:

2.1.1 ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදෙස් රජයන් සමඟ පවත්වනු ලබන සාකච්ඡා හෝ ප්‍රතිපත්තිමය කාරණා හා සම්බන්ධ වන සියලුම සන්නිවේදන මෙන්ම, එම ආකාරයේ සන්නිවේදන නොවන නමුත් ඒ දක්වා වර්ධනය විය හැකි සන්නිවේදන, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හරහා පමණක් සිදු කළ යුතු ය.

2.1.2 ශ්‍රී ලංකාව තුළ දේශීය වශයෙන් දූත මණ්ඩලයක් පිහිටුවා නොමැති හෝ වෙනත් රටක පිහිටි දූත මණ්ඩලයක් මඟින් නියෝජනය නොවන විදෙස් රජයක් සමඟ කිසිදු ආකාරයක සන්නිවේදනයක් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හැර වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් මඟින් සෘජුව ඉදිරිපත් නොකළ යුතු ය.



ගාලු මුවදොර, කොළඹ 01 | දුරකථන ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2472873 | ෆැක්ස් ++ 94 11 2446657 | ඊ-තැපෑල prsec@presidentsoffice.lk

2.1.3 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදෙස් රජයන්, දූත මණ්ඩල, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධානවල නේවාසික නියෝජිතයන් සහ අනෙකුත් සියලුම රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සමඟ සිදු කරනු ලබන ලිපි ගනුදෙනු, රාජ්‍යතාන්ත්‍රික පරිචයට අනුකූලව, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය මගින් සිදු කළ යුතු ය. විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් එවැනි ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ ආයතන සඳහා අවශ්‍ය උපදෙස් හෝ යෝජනා ලබා දීම සිදු කළ හැකි ය.

2.1.4 නගර සභා ඇතුළුව පළාත් සභා සහ පළාත් පාලන අධිකාරී විසින් විදෙස් රජයන්/ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සමඟ සෘජුව තොරතුරු හුවමාරු කර ගැනීම හෝ ලිපි ගනුදෙනු කිරීම සිදු නොකළ යුතු ය.

2.1.5 විශේෂ විධි ක්‍රියා සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, ආරක්ෂාව සහ විදේශ අරමුදල් ආදී විශේෂ ක්ෂේත්‍රයන්හි දී රේඛීය අමාත්‍යාංශ/ ආයතන සහ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ අදාළ අස්ථිත්ව අතර මෙන්ම එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ පහත අවස්ථාවන්හිදී සෘජු අන්තර් ක්‍රියා පැවැත්වීම යෝග්‍ය වනු ඇත. කෙසේවුවත්, මෙම සියලු අන්තර් ක්‍රියා, විශේෂයෙන්, ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට අදාළ වන අවස්ථාවන්හි දී, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය දැනුවත් කළ යුතු වේ:

(අ) දේශපාලනික/ ක්‍රමෝපායික බලපෑමක් සහිත ප්‍රධාන ප්‍රතිපත්තිමය කාරණා විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර සිදු කරන බවට වන පදනම මත මුදල් විෂය භාර අමාත්‍යාංශය විසින් පහත කරුණු සම්බන්ධයෙන් අදාළ විදෙස් රජයන්/ ජාත්‍යන්තර සංවිධාන සමඟ සෘජුව සම්බන්ධ විය හැකිය:

- ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDB), ආසියානු සංවර්ධන බැංකුව (ADB), අප්‍රිකානු සංවර්ධන බැංකු සමූහය (AFBD) ආදී බහුපාර්ශ්වීය/ කලාපීය මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගැනීමට සාකච්ඡා පැවැත්වීම;
- අසල්වැසි රටවල් සඳහා සහාය ලබා දීම වෙනුවෙන් වූ යෝජනා සම්බන්ධයෙන් හැර ණය සහ ප්‍රදාන ආකාරයෙන් ද්විපාර්ශ්වීය සහයෝගිතා සහාය ලබා දීම. අනෙකුත් රටවල් සඳහා සහයෝගිතා සහාය ලබා දීමේ මූලික ක්‍රියාවලිය ද විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් හෝ එම අමාත්‍යාංශය විමසා සිදු කළ යුතු ය;
- විදේශ වාණිජ ණය ගැනීම්/ විදේශ ණය සම්බන්ධ කරුණු;
- දේශපාලනික ස්වභාවයක් නොමැති, විදේශ මූල්‍ය බලපෑම් ඇති හුදු ආර්ථික කාරණා; සහ
- විදේශ විනිමය සම්පත් කළමනාකරණය

ඉහත සියලු තාක්ෂණික කරුණු පිළිබඳ සාකච්ඡා සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය නිරන්තරයෙන් දැනුවත් කළ යුතු ය.

(ආ) ආරක්ෂක විෂය භාර අමාත්‍යාංශයට, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව ප්‍රධාන/ප්‍රමුඛ කාරණා සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව පමණක් තාක්ෂණික සහ අදාළ තොරතුරු සම්බන්ධයෙන් විදෙස් රජයන්/ ශ්‍රී ලංකාවේ පිහිටි ඔවුන්ගේ දූත මණ්ඩල සමඟ ලිපි ගනුදෙනු කිරීම සිදු කළ හැකි ය. මෙම තාක්ෂණික කරුණු පිළිබඳ සාකච්ඡා සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය නිරන්තරයෙන් දැනුවත් කළ යුතු ය.

2.1.6 විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් දැනටමත් එකඟ වී ඇති තාක්ෂණික සහයෝගිතාව, ආධාර සහ සහාය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිහිටි අදාළ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය සමඟ සෘජුව ලිපි ගනුදෙනු කිරීම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් අඛණ්ඩව සිදු කරනු ඇත. කෙසේවුවද, ක්ෂේත්‍ර අතර හෝ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අතර සිදුවන නව ප්‍රතිපත්ති මූලාරම්භයන්ට අදාළ වන කුමන හෝ කරුණකට විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාවය ඇති විය යුතු ය. රේඛීය ආයතන විසින් කාන්තාවන්, ළමුන්, ආහාර සුරක්ෂිතතාව සහ දේශගුණික විපර්යාස

ආදී විෂයයන් පිළිබඳව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් අන්තර්-රාජ්‍ය සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කරන ලද ප්‍රකාශන/වාර්තා සඳහා ද මෙම ක්‍රියාපටිපාටිය භාවිත කළ යුතුය. විශේෂයෙන්ම එවැනි ප්‍රකාශන/වාර්තා සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලියට විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය ඇතුළත් විය යුතුය.

2.1.7 සාකච්ඡා සම්මුති හෝ ප්‍රතිපත්තිමය කාරණාවලට අදාළ නොවන, ආකාරික හෝ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් වන නිල නොවන ලිපි ගනුදෙනු හෝ සාකච්ඡා අමාත්‍යාංශ විසින් ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලයන්හි නියෝජිතයන් සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සෘජුව සිදු කළ හැකි ය. එලෙස සිදු කරනු ලබන නිල නොවන සන්නිවේදනයන්හි පිටපත් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට යොමු කළ යුතු ද යන්න පිළිබඳව අමාත්‍යාංශ විසින් තීරණය කළ හැකිය.

2.1.8 ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල යම් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකු හා සම්බන්ධ වුව හොත් හෝ එලෙස සම්බන්ධ වන අවස්ථාවන් හි දී, එය ආකාරික කරුණක් වශයෙන් ආරම්භයේ දී දැකිය හැකි වුවද, පසුව වඩාත් වැදගත් ප්‍රතිපත්තිමය කරුණක් දක්වා වර්ධනය විය හැකි බැවින්, එම අවස්ථාවන් පිළිබඳ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හැකි ඉක්මනින් දැනුවත් කළ යුතු ය.

2.1.9 යම් විෂයයක් සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හරහා මූලික විධිවිධාන සලසා දීමෙන් අනතුරුව, එම විෂය සම්බන්ධයෙන් විවිධ අමාත්‍යාංශ/ ආයතනවල තාක්ෂණික නිලධාරීන් සහ ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හෝ ජාත්‍යන්තර/රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් අතර තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් සිදු කරන සෘජු ලිපි ගනුදෙනු සඳහා අවසර ඇත. කෙසේ වුවද, එවැනි සියලු සන්නිවේදනයන් පිළිබඳව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය දැනුවත් කළ යුතුය.

2.1.10 කොළඹ පිහිටි දූත මණ්ඩලයක් විසින් යම් හදිසි අවස්ථාවන්හි දී සහ විශේෂ අවශ්‍යතාවයන් ඇති වී තිබෙන විට පවා රේඛීය අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක්/ රජයේ ආයතනයක්, සම්බන්ධ කර ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශයට පිටපතක් ද සහිතව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හරහා ඉල්ලීම යොමු කළ යුතු බවට විදේශ දූත මණ්ඩලවලට උපදෙස් ලබා දී ඇත. ශ්‍රී ලංකා රජයේ අදාළ ආයතනය, දූත මණ්ඩලයක් විසින් යොමු කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී, එකී ක්‍රියාවලිය අනුගමනය කර ඇති ද යන්න තහවුරු කරගත යුතු ය.

2.2 ඉහත සඳහන් ක්‍රමවේදයට අනුගත වීම වැදගත් වන්නේ, පෙර බොහෝ අවස්ථාවන්හි දී ඇති වූ පරිදි එකඟතාවයන්ට පැමිණීමට නොහැකි වූ තත්ත්වවල දී, මුඛ්‍ය ගැටලු සමථයකට පත් කිරීම සඳහා අදාළ ජාතික ආයතනය සහ විදෙස් රජය අතර අතරමැදියා වශයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් සහාය වීම අවශ්‍ය වූ බැවිනි. එවැනි ගැටලු විසඳනු නොලැබුවහොත් හෝ වර්ධනය වීමට ඉඩ සැලසුවහොත්, එය ශ්‍රී ලංකාව සහ විදෙස් රාජ්‍යය හෝ අදාළ සංවිධානය අතර පවතින සමස්ථ ද්විපාර්ශ්වීය සබඳතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදු කරනු ලබන හේතූන් හෝ අන්තර් රාජ්‍ය මතභේද බවට පත්විය හැකි ය. එවැනි අවස්ථා දිගින් දිගටම පැවතීම, අදාළ විදෙස් රජය හෝ අස්ථිත්ව විසින් ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍යයෙන් වැදගත් ක්ෂේත්‍රයක් තුළ, අහිතකර ලෙස ප්‍රතික්‍රියා ගන්නා බවට තර්ජනය කිරීම හෝ එසේ ක්‍රියා කිරීම දක්වා මඟ පෑදිය හැකි ය.

## 3. <u>විදෙස් රජයන්හි අමාත්‍යවරු, තානාපතිවරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පවත්වනු ලබන රැස්වීම්</u>

අමාත්‍යවරු/ රේඛීය ආයතන සහ ශ්‍රී ලංකා රජය යටතේ රජයේ නිලයන් දරන නිලධාරීන්, මෙරටට පැමිණෙන අමාත්‍යවරු, ප්‍රභූන්, දූත මණ්ඩල, තානාපතිවරු හෝ විදෙස් රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීමේ දී විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ සහ අනෙකුත් අදාළ අමාත්‍යාංශවල නියෝජිතයෙකුට ආරාධනා කළ යුතු ය. මෙම අවශ්‍යතාවය ඉටු නොවන අවස්ථාවේ දී, අදාළ ආයතනය විසින් අවම වශයෙන්, රැස්වීම් සාකච්ඡාවේ සාරාංශ වාර්තාවක් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ය.

විදෙස් අමුත්තන් සමඟ පවත්වනු ලබන සාකච්ඡාවේ මට්ටම සහ සුවිශේෂිතාව මත පදනම්ව අදාළ රජයේ ආයතන විසින් එම සාකච්ඡාවන්හි දී ඉදිරිපත් කළ යුතු කරුණු සහ අදාළ තොරතුරු සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගත යුතු ය.

4. <u>ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන නොමැති හෝ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර නොමැති රාජ්‍ය/ රජයන් සමඟ කටයුතු කිරීම</u>

ශ්‍රී ලංකා රජය විසින් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇතිකර නොගත් හෝ පිළිනොගත් රාජ්‍යන්හි/ රජයන්හි නියෝජිතයන් විසින් සංවිධානය කරන ලද උත්සව සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රභූන්/ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගිව වූ අවස්ථා මෑත අතීතයේ දී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය, සැලකිය යුතු අන්දමේ ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය ගැටලු ඇති වීමට තුඩු දී ඇත. මෙවැනි අවස්ථා වැළැක්වීම සඳහා කිසිදු රජයේ ආයතනයක් විසින් එවැනි නියෝජනයන් විසින් පවත්වනු ලබන උත්සව අවස්ථා හෝ කටයුතු සඳහා ආරාධනා පිළිගැනීම/ පිළිගැන්වීම සිදු නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයෙන් විමසීම සිදු කළ හැකි ය.

විමසීම: සන්ධාන අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: <u>cprot@mfa.gov.lk</u>, <u>protocol@mfa.gov.lk</u>

5. <u>විදේශ සබඳතා පිළිබඳ මාධ්‍ය ප්‍රකාශන</u>

අමාත්‍යාංශ/ ආයතන විසින් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සහ සබඳතා, විදෙස් රටවල් සම්බන්ධ කාරණා, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල, එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ආදිය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක මාධ්‍ය ප්‍රකාශනයක් (සම්මුඛ සාකච්ඡා, සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, ඩිජිටල්/ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ආශ්‍රිත ලිපි) විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලිඛිත නිෂ්කාශනයක් නොමැතිව නිකුත් නොකළ යුතුය. එමගින් අනිසි ද්විපාර්ශ්වීය හෝ බහුපාර්ශ්වීය ගැටලු ඇති වීම වැළැක්වීමත්, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සංගත ප්‍රවේශයක් විධිමත් කිරීමත් අරමුණු කෙරේ.

මෙවැනි මාධ්‍ය ප්‍රකාශන සිදු කිරීමේ දී ගරු අමාත්‍යවරු, ගරු නියෝජ්‍ය අමාත්‍යවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තම උපරිම අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

විමසීම: මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
දුරකථන: 0112 437633
විද්‍යුත් තැපැල: <u>publicity@mfa.gov.lk</u>

6. <u>ජාත්‍යන්තර ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්</u>

(අ) ද්විපාර්ශ්වීය, කලාපීය සහ බහුපාර්ශ්වීය ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට අදාළව රේඛීය අමාත්‍යාංශ සාකච්ඡා පැවැත්වීම සහ ඒ සම්බන්ධයෙන් විදෙස් අස්තිත්ව සමඟ ගිවිසුම්වලට එළැඹීම

(i) 2002 අගෝස්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ශ්‍රී ලංකා රජයේ රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් විදෙස් රාජ්‍යවල අධිකාරයන් සමඟ ගිවිසුම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන සාකච්ඡාවලට අදාළ යම් විධිමත් යෝජනා, <u>ප්‍රථමයෙන්</u>, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු ය.

විදේශ අස්තිත්ව සමඟ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමේ දී, එවැනි නෛතික ලේඛන සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයෙන් නිෂ්කාශන ලබා ගැනීම අනිවාර්ය වන අතර, එහිදී එම අමාත්‍යාංශය විසින් විදේශ සබඳතාවලට අදාළව ප්‍රතිපත්තිමය

සහ නෛතික දෘෂ්ටිකෝණයෙන් සංවේදිතා සහ ගම්‍යාර්ථ පවතී ද යනාදී කරුණු පරීක්ෂා කරනු ලැබේ. රේඛීය අමාත්‍යාංශ/ ආයතන සෘජුවම නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වන ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් හැර, ගරු නීතිපතිතුමාගේ අදහස් විමසිය යුතු නෛතික ගම්‍යාර්ථ පවතී නම්, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ නිර්දේශය මත එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් රේඛීය අමාත්‍යාංශය විසින් ගරු නීතිපති වෙත යොමු කළ යුතු ය.

විදෙස් මූල්‍යකරණය, ණය ගැනීමේ වැඩපිළිවෙළ, ණය පහසුකම් ලබා ගැනීම සහ එවැනි ආකාරයේ අනෙකුත් කාරණා සඳහා වගකිව යුතු මුදල් විෂය භාර අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ගරු නීතිපතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අදාළ මාර්ගෝපදේශයන්ට සහ නිෂ්කාශනයන්ට යටත්ව අදාළ කටයුතුවල නිරත වනු ඇත. එවැනි කටයුතු සහ යම් එකඟතා ලේඛන පිළිබඳව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය දැනුවත් කළ යුතු ය.

(ii) විවිධ මූල්‍ය වැඩසටහන්, ණය ගැනීම් විධිවිධාන, ණය ආධාර සහ වෙනත් සමාන ආකාරයේ කාරණා සහ විවිධ අවබෝධතා ගිවිසුම් සහ එකඟතාවයන්ට එළඹීම වෙනුවෙන් මධ්‍යම රජය සහ පළාත් සභා යටතේ ඇති සියලුම ආයතන සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් අංක MF/ERD/2023/01 හා 2023 මාර්තු 27 දිනැති චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

(iii) පළාත් සභා, පළාත් අමාත්‍යවරු සහ විදෙස් රජයන් සමඟ එළඹෙන එකඟතාවයන්:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ, විදේශ රටවල් සමඟ ගිවිසුම්, එකඟතාවයන්/ අවබෝධතා ගිවිසුම් සහ සම්මුතිවලට එළැඹීම සහ ක්‍රියාත්මක කිරීම යන විෂය සංවෘත ලැයිස්තුවෙහි අන්තර්ගත වන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44වන ව්‍යවස්ථාව යටතේ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය වෙත පවරා ඇත.

ගරු ආණ්ඩුකාරවරු/ ගරු ප්‍රධාන අමාත්‍යවරු/ ගරු පළාත් අමාත්‍යවරු නිල විදෙස් සංචාරයන්හි නිරත වීමේ දී, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ පූර්ව උපදෙස් නොමැතිව විදෙස් රටවල පළාත් අස්ථිත්ව සමඟ නෛතික ලේඛන, අවබෝධතා ගිවිසුම් පිළිබඳව හෝ තීරණය නොකළ යුතු ය.

පවතින ව්‍යවස්ථාමය අවශ්‍යතා සැලකීමේ දී, එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයෙන් නිෂ්කාශන ආරම්භයේ දී ම ලබා ගැනීම අනිවාර්ය වන අතර, එහි දී අනෙකුත් කරුණු අතුරින්, විදේශ සබඳතාවලට අදාළව ප්‍රතිපත්තිමය සහ නෛතික දෘෂ්ටිකෝණයෙන් සංවේදිතා සහ ගම්‍යාර්ථ පවතී ද යනාදිය එම අමාත්‍යාංශය විසින් පරීක්ෂා කරනු ලැබේ. ගරු නීතිපතිතුමාගේ අදහස් විමසිය යුතු නෛතික ගම්‍යාර්ථ පවතී නම්, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ නිර්දේශය මත එලෙස එළැඹීමට අපේක්ෂිත නෛතික ලේඛන අදාළ පළාත් සභාවේ රේඛීය අමාත්‍යාංශය විසින් ගරු නීතිපතිතුමා වෙත යොමු කළ යුතු ය.

අදාළ පළාත් සභාව, ඉන් අනතුරුව, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාව මත ඉදිරි කටයුතු සිදු කළ යුතු ය.

(iv) ආධාර හෝ විදේශ ණය ආකාරයෙන් විදෙස් ආයෝජන යෝජනා, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍යකරණ යෝජනා හෝ ද්විපාර්ශ්වීය හෝ බහුපාර්ශ්වීය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ දී මුදල් විෂය භාර අමාත්‍යාංශයේ පූර්ව අනුමතිය ලබා ගත යුතු ය. එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ සහ ගරු නීතිපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. එවැනි නෛතික ලේඛන/ රාමු අත්සන් කිරීමෙන් අනතුරුව ගිවිසුම් දර්ශකය (Treaty Index) යාවත්කාලීන කිරීම සඳහා විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු ය.

(ආ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය

එකඟතා ලේඛනයක අන්තර්ගතය ස්ථාපිත වූ පසු, රජය ඊට බැඳීම සඳහා කටයුතු කිරීමට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, රේඛීය අමාත්‍යාංශය/ ආයතනය සමඟ එක්ව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් පූර්ණ බලතල ප්‍රදානය කෙරෙන පාඨය සකස් කිරීමට කටයුතු කරනු ඇති අතර, එමගින් රජය වෙනුවෙන් අත්සන් තැබීම සඳහා පුද්ගලයෙකු නම් කරනු ලැබේ. 'එකඟතාවය', 'අවබෝධතා ගිවිසුම්', 'සන්ධානය' ආදි කුමන නාමයෙන් සඳහන් වුව ද පවතින සෑම නෛතික ලේඛනයක් සඳහාම මෙම කරුණ අදාළ වේ.

(ඇ) පූර්ණ බලතල

කිසිදු පුද්ගලයකුගේ ලිඛිත අධිකාරය නොමැතිව, රාජ්‍යයේ හෝ රජයේ ප්‍රධානීට සහ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාට පමණක් කිසියම් ජාත්‍යන්තර බැඳියාවක් සඳහා රජය බැඳිය හැකි ය. ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කිරීමට පෙර අනෙකුත් සියලුම පුද්ගලයන් සඳහා විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ ලිඛිත අධිකාරය (පූර්ණ බලතල) අවශ්‍ය වේ. එබැවින්, පූර්ණ බලතල පිළිබඳ සඳහන් ලේඛනය විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අත්සනට යොමු කිරීම සඳහා සකස් කිරීමට හැකි වන පරිදි, අදාළ රේඛීය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියේ පිටපතක් ගිවිසුම අත්සන් කරනු ලබන දිනට පෙර (අවම වශයෙන් සති දෙකක්) ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අක්තපත්‍ර

බහුපාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කරන අවස්ථාවේ දී සහ බහුපාර්ශ්වීය සංසදවලට සහභාගි වීමේ දී, රජයේ නියෝජිතයන් සඳහා මෙන්ම ඔවුන්ගේ අධිකාරය පිළිබඳ විෂය පථය නියම කරනු ලබන අක්තපත්‍ර අවශ්‍ය වේ. අමාත්‍යවරයෙකු විසින් දූත මණ්ඩලය මෙහෙයවනු ලබන අවස්ථාවේ දී, ගරු ජනාධිපතිතුමා විසින් දූත මණ්ඩලය අනුමත කළ විට, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් එවැනි අක්තපත්‍ර බලාත්මක කරනු ඇත. නිලධාරී මට්ටමේ දූත මණ්ඩලයක් සම්බන්ධයෙන් වනවිට, අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දූත මණ්ඩලය අනුමත කිරීමෙන් අනතුරුව, අක්තපත්‍ර පිළියෙළ කරනු ලැබේ. විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අත්සනට යොමු කිරීම සඳහා එම අක්තපත්‍ර සැකසීමට හැකි වන පරිදි, අක්තපත්‍ර සඳහා සිදු කරනු ලබන ඉල්ලීම්, අදාළ අනුමැතියේ පිටපතක් ද සමඟ කල්වේලා ඇතිව (අවම වශයෙන් සති දෙකක්) ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) පාර්ලිමේන්තු අනුමැතිය

ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරනු ලබන පරිචයට අනුකූලව, ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධයෙන් ගිවිස ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පමණක් අවශ්‍ය කෙරේ. කෙසේවුවද, සාමාන්‍යයෙන්, ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පාර්ලිමේන්තුවට සහාගත කළ යුතු අවස්ථා හතරක් වේ. එනම්;

(i) පාර්ලිමේන්තු පනතක් ප්‍රකාරව විශේෂයෙන්, පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍ය වන අවස්ථාවේ දී, උදාහරණයක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, එකී ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාපිත ආරක්ෂාව සහතික කිරීම සඳහා ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත් යම් ගිවිසුමක් පාර්ලිමේන්තු අනුමැතිය සඳහා සහාගත කිරීම අවශ්‍ය වේ.
(ii) උදර්පනය සහ ද්විත්ව බදු ගිවිසුම් වැළැක්වීම.
(iii) දේශීය වශයෙන් ගිවිසුම් බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායකය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අවස්ථාවේ දී.
(iv) ගිවිසුමේ විෂය කරුණ පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා සහාගත කිරීමට තරම අධිගාමික දේශපාලනික වැදගත්කමක් ඇති අවස්ථාවේ දී.

එවැනි අවස්ථාවන්හි දී, අදාළ ගිවිසුම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

(ඊ) සුරක්ෂිතාගාර කටයුතු

ශ්‍රී ලංකාව විසින් එළැඹී ජාත්‍යන්තර ගිවිසුම් තැන්පත් කරනු ලබන සුරක්ෂිතාගාරය වන්නේ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය යි. එබැවින්, ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්සන් කරන ලද ඕනෑම ගිවිසුමක මුල් පිටපත විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ නීති අංශයේ තැන්පත් කිරීම සඳහා එම අමාත්‍යාංශයට යොමු කළ යුතු ය. අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවේ දී, වැදගත් ගිවිසුම් ශ්‍රී ලංකා සම්මුති මාලාවේ (Treaty Series) ප්‍රකාශයට පත් කරනු ඇත.

විමසීම: නීති අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
විද්‍යුත් තැපැල: legal@mfa.gov.lk

7. විදෙස් සංචාර

විදේශ ගත වන ශ්‍රී ලංකාවේ අමාත්‍යවරුන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා විදේශීය ප්‍රභූවරුන් සමඟ නිල හමුවීම් සංවිධානය කරන ලෙස අවස්ථා කිහිපයකදීම විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට ඉතා කෙටි දැනුම්දීමකින් ඉල්ලීම් කර ඇත. එකම විදේශීය අගනුවරකට ශ්‍රී ලංකාවෙන් අමාත්‍යවරු සහ අනෙකුත් ප්‍රභූවරුන් නැවත නැවතත් සංචාරයේ නිරත වූ අවස්ථා කිහිපයක් ඇත. යම් අවස්ථාවන්හි දී, එකම අරමුණක් වෙනුවෙන් වාර ගණනාවක් සිදු කරන මෙවැනි සංචාර හේතුවෙන් අදාළ විදෙස් රාජ්‍යයන් විසින් එහි තාර්කිකත්වය සහ එවැන්නක අවශ්‍යතාව විමසීමට පෙළඹී ඇත. තවද, ප්‍රමාණවත් පූර්ව දැනුම් දීමකින් තොරව දූත මණ්ඩල පහසුකම් ලබා ගැනීම සඳහා සිදු කරන මෙවැනි ඉල්ලීම් හේතුවෙන්, විශේෂයෙන්ම වර්තමාන වාතාවරණය යටතේ සීමිත කාර්ය මණ්ඩලයක් සහ සම්පත් සහිතව ක්‍රියාත්මක වන්නා වූ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල අතිශය දුෂ්කර තත්ත්වයකට පත්වන අතරම ප්‍රතිඵල ප්‍රමාද වීමටද තුඩු දෙනු ඇත.

ගරු අමාත්‍යවරු, ගරු නියෝජ්‍ය අමාත්‍යවරු නිරත වන විදේශ සංචාර පිළිබඳව අදාල ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල දැනුවත් කර නොමැති යම් අවස්ථා අවධානයට ලක් වී ඇත. මෙය අනවශ්‍ය තත්ත්වයන්ට තුඩු දිය හැකි අතර දූත මණ්ඩල, ඔවුන්ට අවශ්‍ය හදිසි සහාය ලබා දීමට හැකි තත්ත්වයක නොසිටිය හැකි ය.

ඇතැම් අමාත්‍යාංශ විසින්, එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් සහ යම් අවස්ථාන්හි දී විදෙස් රජයන්හි අස්ථිත්වයන්ගෙන් එම රටවල නිල/ නිල නොවන සංචාරයේ නිරත වන ශ්‍රී ලංකාවේ අති විශේෂ ප්‍රභූවරුන් සඳහා පහසුකම් සහ අනෙක් කාරණා සිදු කරන මෙන් සෘජු ඉල්ලීම් සිදු කර ඇති බව අවධානයට ලක් වී ඇත. මෙම ක්‍රියාවන්, පරිපාලනමය සහ සන්ධාන පැතිකඩින් මෙන්ම විදේශ සබඳතා සම්බන්ධයෙන් පවත්නා දෘෂ්ටිකෝණයෙන් නුසුදුසු වන්නකි. විදේශ සංචාර සඳහා සිදු කරනු ලබන සියලුම ඉල්ලීම් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය මගින් පමණක් යොමු කළ යුතු ය. හදිසි අවස්ථාවල දී හැර, යොමු කරනු ලබන මෙම සෘජු ඉල්ලීම් ඉටු කිරීමෙන් වැළකී සිටින ලෙස ද, එම ඉල්ලීම් ද විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව පමණක් සිදු කළ යුතු බවට එතෙර පිහිටි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල දැනුවත් කර ඇත.

අප්‍රසන්න තත්ත්වයන් ඇති වීම වැළැක්වීම උදෙසා, සියලුම සංචාර සඳහා සිදු කරන ඉල්ලීම නිසි පරිදි සහ කල් වේලා ඇතිව ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර එය විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය මගින් යොමු කළ යුතු ය. විදේශ සබඳතා පිළිබඳ ඇඟවුම් අවධානයට ගනිමින් මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය කටයුතු කරන අතර, ඊට අදාළව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ එතෙර පිහිටි දූත මණ්ඩලවලට උපදෙස් දෙනු ලැබේ. බොහෝ රටවල අමාත්‍ය සහ ඉහළ මට්ටමේ හමුවීම් සම්බන්ධීකරණ ක්‍රියාවලිය සඳහා ඔවුන්ට ප්‍රමාණවත් ඉදිරි කාලයක් අවශ්‍ය වේ.

අදාළ විදේශ සංචාර සඳහා ගරු ජනාධිපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට ද පියවර ගත යුතු ය.

තවද, අමාත්‍යවරයෙකු/ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් විදෙස් සාකච්ඡා අතරතුර දී ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා විදේශ ප්‍රභුවරයෙකුට ආරාධනා කිරීමට පෙර විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ පූර්ව එකඟතාව ලබා ගත යුතු ය. මෙය, අදාළ ප්‍රභුවරයා අයත් රාජ්‍යය සමඟ ශ්‍රී ලංකාව ගෙන යනු ලබන සබඳතාවය සහ අදාළ කාලයේ දී ශ්‍රී ලංකාව අනුගමනය කරනු ලබන සමස්ථ විදේශ ප්‍රතිපත්ති සන්දර්භය තුළ එවැනි සංචාරයක් යෝග්‍ය දැයි මූලිකව නිශ්චය කිරීම සඳහා අවශ්‍ය වන බැවිනි. පවතින සීමිත සම්පත් හේතුවෙන් එවැනි සංචාරයකින් ශ්‍රී ලංකාවට හිමි විය හැකි ප්‍රතිලාභ මෙන්ම එකී සංචාර සිදු විය යුතු නිසි කාලය යනාදිය ද සැලකීමට ගත යුතු කරුණු වේ.

8. වීසා

නිල සහ පෞද්ගලික සංචාර සඳහා වීසා ලබා ගැනීම සඳහා සහ/ හෝ මෙම වීසා අයදුම්පත්‍ර සඳහා සහාය ලබා ගැනීමට විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට ඉල්ලීම් ගණනාවක් ලැබේ.

නිල තනතුරු දරන පුද්ගලයන්ට ද ඇතුළුව පෞද්ගලික සංචාර සඳහා වීසා පහසුකම් සැලසීමේ කිසිදු අධිකාරයක් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට නොමැත. කිසිදු රජයේ ආයතනයක් විසින් පෞද්ගලික සංචාර සඳහා වීසා අයදුම්පත්වලට සහාය දක්වමින් රාජකාරි ලිපි නිකුත් නොකළ යුතු ය. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු හෝ රජයේ නිලධාරින් විසින් නිරත වීමට අපේක්ෂිත සංචාරය නිල ස්වභාවයේ සංචාරයක් නම්, එම සංචාරයට නියමිත දිනට අවම වශයෙන් සති හතරකට පෙර ඒ සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ය. එවැනි සංචාරයක් සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී ඇත්නම්, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් රාජකාරි අරමුණු වෙනුවෙන් වීසා ලබා ගැනීම සඳහා සිදු කරන ඉල්ලීමට සහාය දක්වමින් තෙවන පාර්ශවීය ලිපියක් (Third Person Note) නිකුත් කරනු ලැබේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වීසා ලබා ගැනීම සඳහා සහාය ලබා ගැනීමට යොමු කරන ඉල්ලීම් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයක් මඟින් නිල සංචාර සඳහා වීසා ලබා ගැනීමට අවශ්‍ය කෙරෙන අවස්ථාවේ දී, සංචාරයේ යෙදීමට අදහස් කරනු ලබන දිනට අවම වශයෙන් සති තුනකට පෙර එවැනි ඉල්ලීම් යොමු කළ යුතු ය.

විමසීම්: චාරිකා අංශය (Travel Unit), විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
දුරකථන: 011 2423900/ 0112 2328753
විද්‍යුත් තැපැල: dgoamd@mfa.gov.lk, travel@mfa.gov.lk

9. රාජ්‍යතාන්ත්‍රික උත්සව සඳහා සහභාගී වීම

විදෙස් රාජ්‍යයක ජාතික දින උත්සවයන්හි දී රජය නියෝජනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් සෑම මසකම හෝ උත්සව පදනමින් අමාත්‍යවරයෙකු නම් කිරීම තීරණය කරයි. එවැනි නම් කිරීමක් සිදු කර ඇති විට, සුදුසු මට්ටමින් ජාතික දින උත්සවයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම අවශ්‍ය වන බැවින්, නම් කරන ලද අමාත්‍යවරයාගේ පෞද්ගලික සහභාගීත්වය අවශ්‍ය වේ. නම් කරන ලද අමාත්‍යවරයාගේ පැමිණීම සම්බන්ධයෙන් යම් දුෂ්කරතාවක් ඇති වූ අවස්ථාවක දී, විකල්ප වැඩපිළිවෙළක් සලසා ගැනීම සඳහා අවම වශයෙන් සති දෙකකට පෙර හෝ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ සන්ධාන අංශය ඒ පිළිබඳව දැනුවත් කළ යුතු ය.

එම අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීමට නියමිත කෙටි ප්‍රකාශයක් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් සකස් කර අදාළ අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබේ.

ජාතික උත්සව පිළිබඳ සඳහන් වන මාසික කාලසටහන ද අදාළ අමාත්‍යවරයාට ඉදිරිපත් කරනු ලැබේ.

විමසීම්: සන්ධාන අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: cprot@mfa.gov.lk, protocol@mfa.gov.lk

රාජ්‍යතාන්ත්‍රික උත්සවවලදී, අමාත්‍යාංශ/ ආයතනවලින් ඕනෑම නියෝජනයක්/ සහභාගි වීමක් ඉහළ මට්ටමෙන් සිදු වීම අවශ්‍ය වේ. උදා: අධ්‍යක්ෂ හෝ ඉහළ.

10. රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලින් ලැබෙන ආරාධනා

තානාපති/ මහ කොමසාරිස් හෝ දූත මණ්ඩල ප්‍රධානි යන තනතුරුවලට පහළ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලින් උත්සව සහ දිවා/ රාත්‍රී භෝජන සංග්‍රහ සඳහා ලැබෙන ආරාධනා අමාත්‍යවරු විසින් පිළිනොගන්නා බවට සහතික වීම වැදගත් ය. මෙය, ස්වෛරී රාජ්‍යයක් සහ සත්කාරක රට වශයෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු තත්ත්වය සුරැකීම සඳහා, අඛණ්ඩව පවත්වාගෙන යාම වැදගත් වන්නා වූ, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සන්ධානයට අනුගත වෙමින් සිදු වන්නකි.

ශ්‍රී ලංකාවේ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ නිලයන් විසින් සිය රජයන්, සංවිධාන හෝ ආයතන වෙනුවෙන් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, ගරු අමාත්‍යවරු, ගරු ආණ්ඩුකාරවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සහ මධ්‍යම/ පළාත්/ පළාත් පාලන රජයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සම්මේලන හෝ වෙනත් යම් අරමුණක් සඳහා එම රටවල අමුත්තන් වශයෙන් සහභාගි වීම සඳහා සිදු කරනු ලබන කිසිදු ආරාධනයක් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාව නොමැතිව පිළිනොගත යුතු ය.

11. ජාත්‍යන්තර/ කලාපීය සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය වෙනුවෙන් සත්කාරක සේවා සැපයීම

ජාත්‍යන්තර/ කලාපීය සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය සම්බන්ධයෙන් සත්කාරක සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. විදෙස් රාජ්‍යයක් හෝ සංවිධානයක් වෙනුවෙන් එවැනි උත්සව අවස්ථාවකට සත්කාරක සේවා සැපයීම සඳහා බැඳීමට පෙරාතුව විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගත යුතු ය. එලෙස එකඟතාවය ඉල්ලීමේ දී සම්මේලනයේ හෝ සම්මන්ත්‍රණයේ පරමාර්ථ, එමඟින් ශ්‍රී ලංකාවට අත්කර ගැනීමට බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵල සහ වාසි, සත්කාරක සේවා සඳහා වන මූල්‍ය වියදම්, සහභාගි වන්නා වූ රාජ්‍යයන්/ සංවිධානවල ලැයිස්තුව, වීසා ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ සන්ධාන සහාය වැනි විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට අවශ්‍ය කෙරෙන යම් සහාය ආදිය පිළිබඳව කෙටියෙන් සඳහන් කළ යුතු ය. සත්කාරක සේවා ලබා දීම සඳහා ඉදිරිපත් වීමට පෙර, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට එතෙර පිහිටි අදාළ විදේශ දූත මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී නිශ්චිත තීරණයකට එළැඹීමට හැකි වනු පිණිස එවැනි ඉල්ලීම් අවම වශයෙන් මසකට පෙර එම අමාත්‍යාංශයට යොමු කළ යුතු ය.

12. ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වන විදෙස් නියෝජිත කණ්ඩායම් සඳහා වැඩසටහන්

කොළඹ නේවාසිකව සිටින තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ රටවල් වලින් මෙරට සංචාරයේ නිරතවන නියෝජිත කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකාවේ අමාත්‍යවරු/ ප්‍රභූවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීමට සෘජුව වේලාවන් වෙන්කර ගැනීම සිදු කරන ආකාරය අවධානයට ලක්ව ඇත. මෙය, පිළිගත් රාජ්‍යතාන්ත්‍රික පරිචයට සහ ක්‍රියා පරිපාටියට පටහැනි ය. තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ රටවලින් සංචාරයේ නිරත වන නියෝජිත කණ්ඩායම් සඳහා අවශ්‍ය කෙරෙන වැඩසටහන් සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ සන්ධාන අංශයට ප්‍රථමයෙන් දැනුම් දිය යුතු අතර, සන්ධාන අංශය විසින් මෙරට බලධාරීන්ගෙන් ඒ සඳහා සුදුසු වේලාවන් වෙන්කර ගැනීමට කටයුතු කරනු ඇත. මෙම ක්‍රියාපටිපාටිය ආණ්ඩුකාරවරු සහ පළාත් අමාත්‍යවරු විසින් ද අනුගමනය කළ යුතු ය. එලෙසම, ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරු හෝ පළාත් අමාත්‍යවරු මුණ ගැසීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින්, ඔවුන් හෝ එම දූත මණ්ඩල කාර්ය මණ්ඩල වෙනුවෙන් සෘජුව සිදුකරන වේලා වෙන්කර ගැනීමේ ඉල්ලීම් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ සන්ධාන අංශයට යොමු කළ යුතු අතර ඒ සඳහා එකඟතාව ලබා ගත යුතු වේ.

13. මෙරට සංචාරයේ නිරත විදෙස් ප්‍රභූවරුන් සමඟ හමුවීම්

මෙරට සංචාරයේ නිරත දූත මණ්ඩල හෝ කොළඹ නේවාසිකව සිටින තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය හෝ ගරු අමාත්‍යවරු මුණ ගැසීමේ දී, එවැනි හමුවීම්

සිදුකළ යුතු සුදුසු මට්ටම සම්බන්ධයෙන් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ඇතුළුව තානාපති කාර්යාලවල සහ මෙරට සංචාරයේ නිරත විදෙස් දූත මණ්ඩලවල පහළ මට්ටමේ තනතුරු හොබවන නිලධාරීන්ට ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය හෝ ගරු අමාත්‍යවරු මුණ ගැසීම සඳහා පහසුකම් සැලසීම සිදු නොකළ යුතුය.

විමසීම්: සන්ධාන අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: cprot@mfa.gov.lk, protocol@mfa.gov.lk

14. ශ්‍රී ලංකාවෙන් සංචාරයේ නිරත වන ප්‍රභූවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ලබාදිය යුතු පහසුකම්

විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට මෙන්ම එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට රාජකාරි හෝ පෞද්ගලික සංචාර සඳහා ශ්‍රී ලංකාවෙන් සංචාරයේ නිරත වන ගරු අමාත්‍යවරුන්ගෙන්, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගෙන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන්, ඔවුන්ට ගුවන් තොටුපොළට පැමිණීමේ දී, අතුරු ගමනාගමනයේ දී (transit), පිටත් වීමේ දී සහ ගුවන් තොටුපළෙහි ප්‍රභූ පර්යන්තයෙහි රැඳී සිටීමට, නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් ආදිය සිදු කර ගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් ඉල්ලීම් ලැබේ.

විදෙස් රජයන් විසින් ගුවන් තොටුපළෙහි ප්‍රභූ පර්යන්ත පහසුකම, විශේෂ අවස්ථාවන්හි දී හැර, සපයනු ලබන්නේ ගෙවීම් පදනමින් බව සඳහන් කළ යුතු ය. එබැවින්, මෙම පහසුකම නොමිලේ ලබා දීමේ හැකියාවක් එතෙර පිහිටි ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල සතු නොවේ. මෙම සන්දර්භය තුළ, ගුවන් තොටුපළෙහි ප්‍රභූ පර්යන්ත පහසුකම ලබා ගැනීමට අපේක්ෂා කරන අදාළ අමාත්‍යවරයා/ ප්‍රභූවරයා/ නිලධාරීන් තමන් අයත් රේඛීය අමාත්‍යාංශය/ ආයතනය මඟින් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හරහා එතෙර පිහිටි විදේශ දූත මණ්ඩලයට එම අදාළ ගෙවීම් පූර්වයෙන් සිදු කළ යුතු ය.

ශ්‍රී ලංකාව සතු නේවාසික දූත මණ්ඩලයක් පවතින කල්හි, එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සංචාරයේ නිරත ප්‍රභූවරුන් සඳහා සන්ධාන සහාය සහ ගුවන් තොටුපළේ සිට හෝටලය දක්වාත්, හෝටලයේ සිට ගුවන් තොටුපළ දක්වාත් ප්‍රවාහන පහසුකම් සලසනු ලබන්නේ රාජකාරි අරමුණු සඳහා පමණි. පවත්නා මාර්ගෝපදේශයන්ට අනුකූලව, පෞද්ගලික සංචාර සඳහා සන්ධාන සහාය ලබා දෙනු ලබන්නේ ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, ගරු කථානායක, ගරු අගවිනිසුරු, ගරු විපක්ෂ නායක සහ ගරු කැබිනට් අමාත්‍යවරු සඳහා පමණි.

තවද, පවත්නා චක්‍රලේඛයන්ට අනුව, ගරු කථානායක, ගරු අගවිනිසුරු, ගරු විපක්ෂ නායක සහ ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ පෞද්ගලික සංචාරවලදී ගුවන් තොටුපළේ සිට හෝටලය දක්වාත්, හෝටලයේ සිට ගුවන් තොටුපළ දක්වාත් දූත මණ්ඩලය විසින් ප්‍රවාහන පහසුකම් සඳහා අවශ්‍ය කටයුතු සලසනු ලබන්නේ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ උපදෙස් මත ය. එබැවින්, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයට එවැනි සංචාර පිළිබඳ නිසි වේලාවට දැනුම් දිය යුතු ය. විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය හෝ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් අනෙකුත් අදාළ වියදම් කිසිවක් දරනු නොලැබේ. දූත මණ්ඩල විසින් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ ගරු විදේශ කටයුතු විෂය භාර අමාත්‍ය වෙනුවෙන් වෙනත් ආකාරයේ විධිවිධාන සලසනු ඇත.

ඒ අනුව, අදාළ අමාත්‍යාංශ/ ආයතන විසින් එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් අනෙකුත් කටයුතු සඳහා විකල්ප ප්‍රවාහන ක්‍රම සැලසිය යුතු අතර රේඛීය අමාත්‍යාංශය/ ආයතනය විසින් එම වියදම් දැරිය යුතු ය.

නවාතැන්, දුරකථන, ප්‍රවාහන, එසවුම් කුලී ආදිය සඳහා වූ කිසිදු බිල්පතක් ගෙවීමට සහ, විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් නිශ්චිතව උපදෙස් ලබා නොදෙන්නේ නම් අත්තිකාරම් මුදල් ලබා දීම දූත මණ්ඩලය විසින් අපේක්ෂා නොකෙරේ. මේ සම්බන්ධයෙන් කිසිදු අවස්ථානුකූල කරුණක් යටතේ ව්‍යතිරේක නොතිබිය යුතු ය. ගරු අමාත්‍ය, ගරු නියෝජ්‍ය අමාත්‍ය, අමාත්‍යාංශය, ආයතනය ආදියේ ඉල්ලීම මත නිල සංචාර සූදානම් කරන විට, එම ඉල්ලීම සිදු කරනු ලබන රේඛීය අමාත්‍යාංශය/ ආයතනය විසින් එම සංචාර සඳහා අදාළ වන සියලුම වියදම් දැරිය යුතු ය.

15. <u>චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීම අධීක්ෂණය</u>

මෙම චක්‍රලේඛයට අනුගත වීම අධීක්ෂණය සඳහා පහත සාමාජිකයන්ගෙන් සමන්විත ඉහළ මට්ටමේ කමිටුවක් පිහිටුවනු ලැබේ.

- ගරු විදේශ කටයුතු විෂය භාර අමාත්‍ය
- ජනාධිපති ලේකම්
- අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
- ලේකම්/ විදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය
- ලේකම්/ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය

කමිටු රැස්වීම් අවශ්‍ය විට කැඳවනු ලබන අතර නිලධාරීන්ට හෝ පුද්ගලයන්ට සුදුසු පරිදි රැස්වීම් සඳහා සහභාගි වීමට ආරාධනා කෙරේ. මෙම චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශයන්ට අනුගත වීමේ තත්ත්වය පිළිබඳ මෙම කමිටුව විසින් අවශ්‍ය පරිදි, වාචිකව හෝ ලිඛිතව අදාළ අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතනවල අවධානයට යොමු කෙරෙනු ඇත.

මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වීම සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගය කරමි.

අත්.කළේ/ ආචාර්ය එන් එස් කුමානායක
ජනාධිපති ලේකම්

දුරකතන: + 94 11 2354420 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk

පිටපත්

1. ගරු නීතිපති
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩයේ ලේකම්
4. මහ බැංකුවේ අධිපති
5. මැතිවරණ කොමසාරිස් ජනරාල්
6. විගණකාධිපති
7. පාර්ලිමේන්තුවේ මහ ලේකම්
8. ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී
9. පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
10. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්